# මෙත් පෑ මෙත්තානන්ද

28/11/68. දිනමිණ.



**මෙත්තානන්ද මහතා අභාවප්‍රාප්ත වී මේ නොවැම්බර් 2 දට වසරක් පිරෙයි. ඒ නිමිත්තෙන් මරදාන පාර "මෙත්තානන්ද මාවත" යනුවෙන් නැවත නම් කල යුතුයයි සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය යෝජනාවක් සම්මත කරගෙන ඇත.**

අවුරුදු හාරසිය ගණනක විදේශාධිපත්‍ය යෙන් පිරිහී ගිය සිංහල ජාතියත්, බුදු සසුනත් නගා සිටුවීමේ මහත් වෑයමක යෙදුණු අනගාරික ධර්මපාල තුමා ඇරඹි සාමකාමී සටනේ හා ඉදිරි ගමනේ මල් පල ගැන්වීමට පෙර බ්‍රිතාන්‍ය පාලන කාලය තුළදීම ධර්මපාල තුමා කීර්තිශේෂභාවොපගත විය. අනගාරික ධර්මපාල තුමා ඇරඹි ඒ උදාර වැඩ පිළිවෙල සුදු පාලකයන් වෙතින් නීය... වට නැංවීම එදා සුකර නොවුවත්, ලංකාවට ජාතික නිදහස ලැබීමෙන් අවුරුදු කිහිපයක් ගත වීමෙන් පසු නිදහස් රාජ්‍යයේ දේශීය පාලකයන් ලවා බලවත් උද්ඝෝෂණ නැංවීමෙන් එයින් ඇතැම් කරුණු ඉටු කරවා ගැනීමට ගත ව අවුරුදු කිහිපය තුළ හැකි වූයේය.

දහනව වන සිය වසේ අවසාන කොටසත්, විසිවන සියවසේ මේ දක්වාත් විශේෂයෙන් සිංහල ජාතියත්, බුදු සසුනත් නගා සිටුවීම පිළිබඳ කරුණු සෙවීමක යෙදෙන්නකුට අනගාරික ධර්මපාල - කර්නල් හෙන්රි ස්ටීල් ඔල්කට් - එල්. එච්. මෙත්තානන්ද යන ත්‍රිමූර්තිය වෙසෙසින් ඉස්මතුව පෙනෙයි. සිංහල ජාතියත් බෞද්ධයාත් අවදි කළ ධර්මපාල තුමාත්, බෞද්ධ අධ්‍යාපනය නැංවූ කර්නල් ඔල්කට් තුමාත්, එම දෙපළ ගෙන ගිය වැඩ පිළිවෙල ඉදිරියටම ගෙන ගිය මෙත්තානන්ද මහතාත් ක්‍රියා කළේ නිශ්චරණීයාශයෙන්මය.

තමන් වෙත තුබූ එක්කම උසස්ම බලාපොරොත්තුව සිංහල ජාතියේ චිර ජීවනයත්, බුදු සසුනේ උත්තරීතර බැබළීමත් මිස ඇමති පදවි, තානාපති පදවි, සෙනෙට් මන්ත්‍රී පදවි, උසස් නිලතල හෝ වෙනත් නම්බුනාම ලබාගැනීම නොවන බව එතුමන්ගේ කීර්තිශේෂභාවොපගත චරිතාපදානයත් අප වෙත දැන් හෙළිදරව් කරහමාරය.

1956 දී මහජන එක්සත් පෙරමුණ බලයට පත්වීමත් සමග දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා එල් එච්. මෙත්තානන්ද මහතා එව කට පදිංචිව සිටි නිවසට වැලිපෝන් මඟින් කථා කළේය. තමන් පිහිටුවන නව රජයේ අධ්‍යාපන ඇමති ධුරය භාර ගැනීමට කැමැති දැයි එතුමන් මෙත්තානන්ද මහතාගෙන් විමසීය. ඇමති ධුරයක් භාර ගැනීමට තමා තුළ ඇති අසතුට ස්තූති පෙරදැරිව සැල කළ මෙත්තානන්ද මහතාගෙන් එසේ නම් චීනයේ ලංකා තානාපති පදවිය භාරගන්නා ලෙස බණ්ඩාරනායක මැතිතුමන් ඉල්ලා සිටියේය. ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමන්ගේ කාරුණික ඉල්ලීම් එක වරටම ප්‍රතික්ෂේප කිරීම යෝග්‍ය නොවන බැවින් කල්පනා කර බලා පසුව පිළිතුරක් දෙන බව ඊට පිළිතුරු වශයෙන් මෙත්තානන්ද මහතා පැවසීය. වැලිපෝන් සාකච්ඡාව හමාර කළ මෙත්තානන්ද මහතා තමා සමග නිවසේ එවේලේ සාකච්ඡා කරමින් සිටි තම හිතවතුන් වෙත විස්තර සැල කරමින් චීනයේ තානාපති පදවිය ද තමා භාර නොගන්නා බවත්, තමාගේ පරමාර්ථය ඇමති පදවි හෝ තානාපති පදවි භාර ගැනීම නොවන බවත් සැල කළේය.

එල්. එච්. මෙත්තානන්ද මහතාගේ දර්ශණය අනුව බටහිර අධිරාජ්‍යවාදයත්, උච්ඡේදවාදී කොමියුනිස්ට්වාදයත ශාස්ත්‍රවාදී කතෝලික වාදයත් සිංහල බෞද්ධ සංස්කෘතියට හා පොදු මානව නිදහසටත් එක හා සමානව අහිතකර ත්‍රිත්ව බලවේගයන් ය. ධර්මයෙන් හෝ අධර්මයෙන්, සාමයෙන් හෝ බලයෙන්, යුක්තියෙන් හෝ අයුක්තියෙන් සිය බල පරාක්‍රමය පැතිරවීමේ හා තහවුරු කිරීමේ ප්‍රජාතන්ත්‍ර විරෝධී කවර පිළිවෙතකට වුව ද මෙත්තානන්ද මහතා තරයේ විරුද්ධ විය.

පුවත් පත් කොමිෂන් සභාවක් පත් කළ යුතු යැයි උද්ඝෝෂණය කොට ඒ කොමිෂන් සභාව ඉදිරියෙහි ජනතාව පුදුමයට පත් කරවමින් විවිධ බලවේගයන් පිළිබඳ මනා විවරණයකුත් ප්‍රවෘත්ති පත්‍ර ආයතන හා ඒවායේ ප්‍රපත්තීන් පිළිබඳ බලගතු විවේචනයකුත් යෙදුණ මෙත්තානන්ද මහතා පුවත් පත් ආයතන රජයට පවරා ගැනීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් වූ විට පුවත් පත් නිදහස ආරක්ෂා කර ගැනීමේ පතාක යෝධයකු ලෙස ක්‍රියා කළේය.

ඇතැමකුට වරෙක උග්‍ර ජාතිවාදියෙකු ලෙසත් විටෙක බෞද්ධ අන්තවාදියකු ලෙසත්, තවත් විටෙක උග්‍ර කතෝලික විරෝධියකු හෝ කොමියුනිස්ට් විරෝධියකු ලෙසත් මෙත්තානන්ද මහතා පෙනෙන්නට ඇත.

ද්‍රවිඩ ආක්‍රමණයක් පිළිබඳ කරුණු මෙත්තානන්ද මහතා රටටත් ජනතාවටත් සැල කිරීමකදී බෞද්ධ කතෝලික - ක්‍රිස්තියානි සිංහලයින්ගේ ප්‍රශංසාවටත්, ද්‍රවිඩයන්ගේ උදහසටත්, කතෝලික ආක්‍රමණය ගැන කරුණු අනාවරණය කළ විට බෞද්ධ හා හින්දූන්ගේ පැසසුමටත්, කතෝලිකයන්ගේ අප්‍රසාදයටත්, විජාතික ජාවාරම් ගැන කතා කරන විට බෞද්ධ - හින්දු - මහමද් - ක්‍රිස්තියානි - කතෝලික සියල්ලන්ගෙන් සැදුම් ලත් ලාංකිකයන්ගේ ගෞරවාදරයටත්, බෝරා - පරවර - ඉන්දියානු ආදී විජාතිකයන්ගේ ද්වේෂයටත්, ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ ඒකාධිපති බලවේග හා තර්ජන ගැන කරුණු හෙළි දරව් කරන විට සිංහල - ද්‍රවිඩ - මුස්ලිම් - බර්ගර් බෝරා - පරවර ආදී ප්‍රජාතන්ත්‍ර ගරුක සකල ලක්වැසි ජනතාවගේම ආදර ගෞරවයටත්, ප්‍රජාතන්ත්‍ර විරෝධීන්ගේ පිළිකුලටත්, පුවත් පත් වල ජාති විරෝධී ප්‍රතිපත්ති අනාවරණය කරන විට ජනතාවගේ මල් පොකුරුවලටත්, පුවත් පත් හිමියන්ගේ ගල් මුගුරු වලටත්, පත්‍ර නිදහස ආරක්ෂා කර ගැනීමට සටන් වදින විට පත්‍ර හිමියන්ගේ තුති මල් දාමයන්ටත්, ඇතැම් ජනතා කණ්ඩායම්වල වද මල් මාලා වන්ටත් ආදී වශයෙන් උද්වේගකර හා සැනසිලිදායක ද්වත්වාකාර විවිධ බලවේගයන්ට හා ඒවායේ ක්‍රියාකාරිත්වයනට "මෙත්" පාමින් කවර දෙසකින් වුවද හැමූ චණ්ඩ මාරුතයෙක් වුවද සෙලැවිය නොහැකිව වැජඹුණ ඇල්. එච්. මෙත්තානන්ද මහත්මා පැහැදිලි දර්ශණයකින් යුත් ස්වකීය නිදහස් පවිත්‍ර ප්‍රතිපත්තීන් "පක්ෂ දේශපාලනය" අභිබවා සුරැකීම එතුමන්ගේ උදාර සාර්ථක ජීවිතයේ කැපී පෙනුණ විශේෂතම අංගය විය. මෙත්තානන්ද මහතාගේ ව්‍යායාමය වූ කලී සිංහල ජාතියේත්, බුද්ධ ශාසනයේත් පොදු ලක්වැසි ජනතාවගේත් යහපත පිණිස වූවා මිස පුද්ගල කණ්ඩායමක, පක්ෂයක හෝ තනි තනි පුද්ගලයන්ගේ යශෝ කීර්තිය හා බලපරාක්‍රමය තහවුරු කිරීම සඳහා වූවක් නොවිය.

# තිස්ස කුරුකුලනාථ විසිනි

සිංහල රාජ්‍ය භාෂාව කිරීම, මව් බසින් විද්‍යාව ඉගැන්වීම, බෞද්ධ විදුහල වලට අහිමිව තුබූ උසස් ශ්‍රේණි ලබා දීම, ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම, අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි දසාධාරණකම් මහ හරවා ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති මට මං සැලසීම, බෞ... තොරතුරු පරීක්ෂක... වාර්තාව හා එහි නිර්... ක්‍රියාත්මක කරවා ගැ... ක්‍රියා කිරීම, රජයේ හා... හමුදාවල අබෞද්ධ... කාරිත්වය ගැන කරුණු... දරව් කිරීම, පුවත්... කොමිෂන් සභාව, දිවයි... කවර ප්‍රදේශයක හෝ ... කරන සිංහල බෞද්ධ... ගේ උරුමයන් ආරක්ෂා... ගැනීම හා ඊට තර්ජන... විය හැකි විවිධ අංශයන්... බඳව ජනතාවට මනා... බෝධයක් ලබාදී ... ති... ආදී විපුල ප්‍රයෝජන... දු... යතු රාශියක ... ජාතික - ... ණ වල ... එල්. ... මෙ... මහතා ... සංවිධාන... ස් ති ... දුර්වලවූ ... රණව... සිංහල ... ද්ධ ජන...

නායකත්වය ... දෙ... අනගාරික ධර්මපාල තු... කර්නල් ඔල්කට් තු... ඇරඹූ "බෞද්ධ - ජා... ඉදිරි ගමන හා ඒ ... පුනරුත්ථාපනය එල්. ... මෙත්තානන්ද ... බොහෝ දුරට සපුරාලූ...